**යටවත්ත ප්‍රාදේශීය සභාව - 2023**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

යටවත්ත ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශන වලින් 2023 දෙසැම්බර් 31 දිනට යටවත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට ( ශ්‍රී ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය .

## 1.4 විගණන විෂය පථය ( මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (i) | 24 වගන්තිය | සභාව විසින් පවත්වාගෙන යනු ලබන පාරවල් සහ පටු මංමාවත්වල නාම ලේඛනයක් දක්වමින් සභාවට අයත් සියළුම මාර්ග ඇතුළත් කර ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් නොතිබුණි. | මාර්ග මැනුම් කිරීම ආරම්භ කර ඇත. එය අවසන් වූ වහාම මාර්ග ඉන්වෙන්ට්‍රිය සකස් කිරීමට කටයුතු සිදු කරන බව. | මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කර පවත්වාගෙන යා යුතුය. |
| (ii) | 128 වගන්තිය | සභාව සතුව පවතින සුසාන භූමි 37 ක අයිතිය පවරාගෙන ගැසට් පත්‍රයේ පළකර ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කර නොතිබුණි . | රජයට අයත් සුසාන භූමි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති බව. | පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය . |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | **2016 පෙබරවාරි 23 දිනැති අංක 1955/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන ( සම්මත අතුරු ව්‍යවස්ථා ) පනත** | | | |
| (i) | පීඩාකාරි හා අන්තරාදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 04 වන වගන්තිය | සමාලෝචිත වර්ෂයේ සිදු කරන ලද සමීක්ෂණයට අනුව පීඩාකාරි හා අන්තරාදායක ව්‍යාපාර ආයතන 105 ක් සඳහා රු.90,000 ක බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | 2024 වර්ෂයේදී එවැනි ගැටළු උද්ගත නොවන ලෙස වෙළඳ බලපත්‍ර ගාස්තු අය කිරීමට කටයුතු කරන ලෙස ආදායම් පරීක්ෂක හා විෂය නිලධාරි දැනුවත් කර ඇති බව. | විධිමත්ව සමීක්ෂණයක් සිදු කර විධිමත්ව බලපත්‍ර ගාස්තු අයකළ යුතුය . |
| (ii) | ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 4(i ) වගන්තිය | සභා බලප්‍රදේශයෙ තුළ ත්‍රීරෝද රථ නවතා තැබියයුතු ස්ථාන සහ එක් එක් ස්ථානයේ නවතා තැබියයුතු උපරිම ත්‍රීරෝද රථ සංඛ්‍යාව මහා සභාව මඟින් තීරණය කර එය ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත්කළයුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි . | ඉදිරියේදී මහා සභාව නැවත පිහිටුවීමෙන් පසු ඒ වෙත යොමු කර එය ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත් කරන බව. | ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත් කර ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| (i) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛයේ 04 ඡේදය | නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍රයක් භාවිතා කර නොතිබුණි . | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යටතේ නව ඇඟිලි සළකුණු යන්ත්‍රයක් මිලදී ගැනීමට මිල ගණන් කැඳවීමේ කටයුතු සිදු කරමින් පවතින බව . | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුය . |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 2013 ඔක්තෝබර් 07 දිනැති අංක 21/2013 දරන චක්‍රලේඛයේ 02(අ) ඡේදය | පැය 8 ක කාලයක් සම්පූර්ණ නොකල නිවාඩු දින 6 ක් සඳහා නිලධාරීන් 4 කට නිවාඩු දින වැටුප් රු.7,411 ක් ගෙවීම් කර තිබුණි. | ඉදිරියේදී නිවාඩු දින වැටුප් සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛය අනුව කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (iii) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාවට අයත් වාහන 09 ක ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාව වසර 1 ත් 4 ත් අතර කාලයක් තුළ සිදුකර නොතිබුණි . | වාහන 09 ක් සඳහා ඉන්ධන දහන පරීක්ෂාව කඩිනමින් සිදු කිරීමට අවශ්‍ය කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,791,667 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,670,551 ක් විය .

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කල තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,158,180 | 1,099,930 | 1,099,930 | - | 1,503,429 | 1,475,569 | 1,475,569 | - |
| (ii) | කුලී | 1,345,777 | 1,148,251 | 1,131,119 | 48,132 | 1,219,554 | 1,048,506 | 1,048,506 | 31,000 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 923,748 | 936,468 | 936,468 | - | 687,030 | 677,750 | 652,030 | 9,000 |
| (iv) | වෙනත් ආදායම් ජල | 1,688,305 | 1,780,585 | 1,697,420 | 408,385 | 1,599,730 | 1,651,440 | 1,692,390 | 325,220 |
| | එකතුව | 5,116,010 | 4,965,234 | 4,864,937 | 456,517 | 5,009,743 | 4,853,265 | 4,868,495 | 365,220 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජල ගාස්තු<br>සභාව විසින් පවත්වාගෙන ගිය දැනට අක්‍රීයව පවතින මැදියාපොල ජල ව්‍යාපෘතියේ, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඒකක 58 ක් සඳහා රු.101,845 ක ජල ගාස්තු අයකර නොතිබුණි. | 2024 මාර්තු 31 දින වන විට රු.35,690 ක් අයකර ගෙන ඇත. හිඟය අයකර ගැනීම සඳහා සෑම මසකම ජංගම සේවා පවත්වන අතර, සභාවේ ආදායම් පරීක්ෂක විසින් ක්ෂේත්‍රගතවද හිඟ මුදල් රැස් කිරීම සිදුකරන බව. | ලැබියයුතු මුදල් අයකර ගතයුතුය. |

### 2.3 අධිභාර

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවලුන්ට එරෙහිව ඉකුත් වර්ෂවල පැනවූ රු.32,259 ක අධිභාර මුදල් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර නොතිබුණි . | වර්තමාන තත්ත්වය පිළිබඳ විමසා ලිපියක් පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇතත්, මේ වන තෙක් පිළිතුරු ලැබී නොමැත . | අධිභාර අයකර ගැනීමට කටයුතු කළයුතුය . |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආදාහනාගාරයක්, පොදු වැසිළියක් ආයුර්වේද මධ්‍යස්ථානයක් හා පොදු වෙළඳපලක් ස්ථාපිත කිරීම කෙරෙහි අවධානය යොමු නොකර සභාවේ පුනරාවර්ථන ආදායම වූ රු.75,060,301 ක මුදලක් ස්ථාවර තැන්පතු 06 ක හා ඉතිරි කිරීමේ ගිණුමක ආයෝජනය කර තිබුණි . | ආදාහනාගාරය ඉදිකිරීම සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවන බවත්, පොදු වැසිකිළියක් සෑදීමට ඉදිරියේදී කටයුතු කරන බව. | මහජනයාගේ අවශ්‍යතා ඉටු කිරීමට කටයුතු කළයුතුය . |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේ යටවත්ත ප්‍රාදේශීය සභා ගොඩනැඟිල්ලේ සභා ශාලාව ඉදිකිරීමේ ව්‍යාපෘතිය ඇස්තමේන්තු ප්‍රකාරව නියමිත ස්ථානයේ ඉදිනොකිරීම මත රු.106,710 ක අතරුඳවුම් මුදල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නිදහස් නොකර තිබියදී සභාව විසින් 2016 වර්ෂයේ කර්මාන්ත ණය හිමියන්ට ගෙවන ලද රු.106,710 ක අතරුඳවුම් මුදල සභා අරමුදලට අතිරේක වැය බරක් වී තිබුණි. | මු.රෙ. 104(3) පරීක්ෂණයක් සිදුකරනු ලබන බව. | වගකිවයුතු පාර්ශවයන් අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබියයුතු ගිණුම් ශේෂ 04 ක එකතුව රු.456,517 ක් විය. ඉන් වසර 1 ත් වසර 5 ත් අතර, කාල පරාසයක එකතුව රු.138,340 ක් හා වසර 5 ක කාලයක් ඉක්මවා තිබුණු ගිණුම් ශේෂවල වටිනාකම රු.31,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි . | අයකර ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව. | අයකර ගැනීමට කටයුතු කල යුතුය . |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් නිකුත් කරනු ලබන ගොඩනැඟිලි සංවර්ධන බලපත්‍ර 40 ක බලපත්‍ර කාල සීමාව ඉක්මවා ගොස් තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් සංවර්ධන බලපත්‍රයේ වලංගු කාලය දීර්ඝ කිරීමට හෝ පදිංචි වී ඇත්නම් ඒ සඳහා අනුකූලතා සහතික ලබාදීමට හෝ කටයුතු කර නොතිබුණු අතර ඒ සම්බන්ධව පසු විපරමක්ද සිදුකර නොතිබුණි . | වලංගු කාල සීමාව අවසන් සංවර්ධන බලපත්‍ර සම්බන්ධයෙන් පසු විපරම් සිදු කිරීමට තාක්ෂණ නිලධාරීන් හට උපදෙස් ලබාදී ඇති බව. | අදාල කටයුතු පරීක්ෂා කර අනුකූලතා සහතික නිකුත් කිරීමට හෝ විධිමත් ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට කටයුතු කල යුතුය . |

## 3.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 මාර්තු 19 දින රු.100,000 ක් වියදම් කර සකස් කරන ලද ජීව වායු ඒකකය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් නිෂ්ක්‍රීයව පැවතුණි. | මෙම ජීව වායු ඒකකය ඉවත් කිරීම සුදුසු බවට නිර්දේශ කර ඇති බව. | අළුත්වැඩියා කර නැවත ප්‍රයෝජනයට ගැනීමට හෝ ඉවත් කිරීමට කටයුතු කළයුතුය. |